ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
UVA PROVINCIAL DEPARTMENT OF EDUCATION

# පෙරහුරු පරීක්ෂණය - 2017

| 11 ශ්‍රේණිය | කතෝලික ධර්මය - I | කාලය පැය 01 |
|---|---|---|

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න
- උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් සැලකිල්ලෙන් කියවා පිළිපදින්න
- 01 සිට 40 තෙක් වූ එක් එක් ප්‍රශ්නයට 1,2,3,4 යන පිළිතුරු වලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුර තෝරාගෙන එය උත්තර පත්‍රයේ පිටුපසින් දැක්වෙන උපදෙස් පරිදි (×) යොදා දක්වන්න
- වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න

---

01. දේශක දිවැසිවරයෙකු වන්නේ
1. ජෝවෙල් 2 නාතාන් 3 ආමොස් 4 සෙකරියා

02. අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත රචනා වී ඇති කාලය වන්නේ
1 ක්‍රි.ව 50-60 2 ක්‍රි.ව 70-75 3 ක්‍රි.ව 80- 90 4 ක්‍රි.ව 85 - 90

03. සාර්ථකව හා ධර්මිෂ්ඨව ජීවත්වීමේ හැකියාව යන අරුත් ඇති හෙබ්‍රෙව් වචනය වන්නේ
1 මතෙටේස් 2 මැසරොටික් 3 හොත්මා 4 සෙප්ටුවාජින්ත

04. ශුද්ධ වූ සභාවේ පළමු ප්‍රාණ පරිත්‍යාගිවරයා වන්නේ
1 ශුද්ධ වූ ස්තේපන්තුමා 2 ශුද්ධ වූ ජාකොබ් තුමා
3 ශුද්ධ වූ ජෝහාන් තුමා 4 ශුද්ධ වූ පේදුරු තුමා

05. ඔබ ක්‍රිස්තුවරයාණෝය ජීවමාන දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝය මෙලෙස ප්‍රකාශ කළේ
1 පාවුළු තුමා 2 පේදුරු තුමා 3 ආරොන් තුමා 4 ජොහාන් තුමා

06. ශුද්ධ වූ සභා ඉතිහාසය බෙදෙන ප්‍රධාන යුග
1. 4 කි 2. 03 කි 3. 05 කි 4. 02 කි

07. තෙරේසා මව්තුමිය ආරම්භ කළ පැවිදි නිකාය වන්නේ
1 ලොරෙටෝ පැවිදි නිකාය
2 යහපත් එඩේරා පැවිදි නිකාය
3 දයාවේ දූතිකාවෝ පැවිදි නිකාය
4 ශුද්ධ වූ පවුලේ පැවිදි නිකාය

08 පළමු පණතට විරුද්ධ ක්‍රියාවක් නොවන්නේ
1 නැකතට මුල්ගල තැබීම
2 යන්ත්‍ර, මන්ත්‍ර, හූනියම් කිරීම
3 දිව්‍ය පූජාවට ක්‍රියාකාරීව සහභාගී නොවීම
4 සාස්තර ඇසීම

09 මා නුඹ කුසෙහි පිළිසිඳ ගැනීම ඇති කරන්නටත් පෙර පටන් මම නුඹ හඳුනා ගතිමි. මෙලෙස කැඳවීම ලද දිවැසිවරයා වන්නේ
1 ජෙරමියා 2 යෙසායා 3 එසකියෙල් 4 ආමොස්

10 බොරු කීම නිසා තම ජීවිතය අහිමිකරගත් විවාහක යුවළ වන්නේ
1 ආබ්‍රහම් සහ පාරා 2 අනනියස් සහ සපීරා
3 අනනියස් සහ සාරා 4 ආරොන් සහ සපීරා

11 අටවන දේව පණතට විරුද්ධ පාපයක් නොවන්නේ

www.edudept.up.gov.lk

1 කටකතා පැතිරවීම 2 නිල රහස් එළි කිරීම
3 කේලම් කීම 4 අධික ලාභ, පොලී, කොමිස් ලබාගැනීම

12. දෙවියන් වහන්සේගේ මධ්‍යස්ථකයානෝ යන විශ්ව ලේඛනය ලියූ ශුද්ධෝත්තම පියතුමා වන්නේ
1 XII ශුද්ධෝත්තම පියතුමා
2 VI වන සියුස් ශුද්ධොත්ත්ම පියතුමා
3 VII වන සියුස් ශුද්ධෝත්තම පියතුමා
4 දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමා

13. ජනවන්දනා වර්ෂයට අයත් සති ගණන වන්නේ
1. 57 2. 53 3. 52 4. 51

14. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ රාජ තේජසින් ජෙරුසලමට ඇතුළුවීම සිහිපත් කරන්නේ
1 මහා සිකුරාදා දින 2 අලු බදාදා දින
3 මහා බ්‍රහස්පතින්දා දින 4 ගොබ් ඉරු දින

15. පාස්කු ඉරිදායින් දින 40 කට පසුව සමරනු ලබන්නේ ජේසුස් වහන්සේගේ
1 උත්පත්ති මංගල්‍යයයි
2 උත්ථාන මංගල්‍යයයි
3 ස්වර්ගාරෝහණ මංගල්‍යයයි
4 කැප කිරීමේ මංගල්‍යයයි

16. පශ්චත්තාපය සහ බලාපොරොත්තුවේ ලකුණක් ලෙස අර්ථ දැක්වීමට යොදා ගනු ලබන වර්ණය වන්නේ
1. දම් 2. සුදු 3. රතු 4. කොළ

17. දිව්‍ය පූජාව තුළ ආරම්භයේ දක්නට ලැබෙන ගෞරවයේ සංකේතයක් නොවන්නේ
1 නමස්කාරය 2 පූජාසනය සිපාචාරය
3 දල්වන ලද පහන් 4 දිව්‍ය සත් ප්‍රසාද ආශිර්වාදය

18 උත්තම පූජක යාච්ඤාව සඳහන් වන සුභාරංචි ග්‍රන්ථය වන්නේ
1 මතෙව් සුභාරංචිය 2 ජොහාන් සුභාරංචිය
3 මාක් සුභාරංචිය 4 ලූක් සුභාරංචිය

19 ජෙරුසලම නගරයට මුහුණලා ඔලීව කන්දේ බටහිර බෑවුමෙහි පිහිටා ඇති ස්ථානයකි
1 සමාරිය 2 ගලීලය 3 ජෝර්දානය 4. ගෙත්සෙමෙනෙය

20 ඉරුදින ජන වන්දනාවේදී තෙවන වසර සඳහා යොදා ගනු ලබන සුභාරංචි ග්‍රන්ථය වන්නේ
1 මතෙව් සුභාරංචිය 2 ලූක් සුභාරංචිය
3 මාක් සුභාරංචිය 4 ජොහාන් සුභාරංචිය

21. යාවේ සම්ප්‍රදායට අයත් කතාවක් නොවන්නේ
1 ආදම් හා ඒව පාපයට වැටීම
2 කායින් හා ආබෙල් සිද්ධිය
3 නෝවා සමග ගිවිසුම
4 මැවීම පිළිබඳ දෙවන කතාව

22. ක්‍රිස්තියානු බයිබලයේ නව ගිවිසුමට අයත් පොත් සංඛ්‍යාව වන්නේ
1. 39 2. 27 3. 46 4. 73

23. දෙවියන් වහන්සේ කායින්ට ලබාදුන් දඬුවමක් නොවන්නේ
1 පොළොවෙන් නුඹ නෙරපා දමනු ඇත
2 නුඹ ගෙයක් දොරක් නැති මිහිපිට ඉබාගාතේ යන මිනිහෙක් වන්නෙහිය
3 මින් මතු ඔබ පොලෝ තලය මත සාප ලද්දෙක් වේවා
4 දිවි ඇති තාක් නුඹ වෙහෙස මහන්සි වී එයින් ආහාර ලබා ගන්නෙහිය

24 දෙවියන් වහන්සේ ආබ්‍රහම්තුමා සමග ඇති කරගන්නා ලද ගිවිසුමේ බාහිර සලකුණ වන්නේ
1 දේදුන්න 2 සුළඟ 3 ගිනිදැල්ල 4 චර්මඡේදනය

www.edudept.up.gov.lk

25 ශ්‍රාවකයන් හැත්තෑ දෙනාගේ ධර්මදූත මෙහෙය පිළිබඳව සඳහන් කරන සුභාරංචි කතුවරයා වන්නේ
1 ශුද්ධ වූ මතෙව් තුමා
2 ශුද්ධ වූ මාක් තුමා
3 ශුද්ධ වූ ලූක් තුමා
4 ශුද්ධ වූ ජොහාන් තුමා

26. යුක්තියට සා පිපාසා ඇත්තෝ භාග්‍යවන්තයෝය ......................................... මෙහි හිස්තැනට සුදුසු වචනය වන්නේ
1 ඔව්හු තෘප්තිමත් වන්නෝය
2 ඔව්හු දයාව ලබන්නෝය
3 ඔව්හු දෙවියන් වහන්සේ දකින්නෝය
4 ඔව්හු සැනසීම ලබන්නෝය

27. මතෙව්තුමාගේ සුභාරංචියේ 5, 6 සහ 7 පරිච්ඡේද වල අන්තර්ගතය වන්නේ
1 භාග්‍ය අට
2 දන්දීම පිළිබඳ ඉගැන්වීම
3 කන්ද උඩ දේශනාව
4 උපවාසය පිළිබඳ ඉගැන්වීම

28. ප්‍රසාද ස්නාපනය දානය කිරීමේදී උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේව සලකුනු කිරීම සඳහා යොදා ගනු ලබන සංකේතාත්මක ද්‍රව්‍ය වන්නේ
1 ජලය
2 පාස්කු ඉටිපහන
3 සුදු වස්ත්‍රය
4 ශුද්ධ වූ තෛලය

29. දායාධික මනස්ථාපය හඳුන්වන තවත් නමක් වන්නේ
1 ගෞරවයේ මනස්ථාපය
2 විශ්වාසයේ මනස්ථාපය
3 බලාපොරොත්තුවේ මනස්ථාපය
4 ප්‍රේමයේ මනස්ථාපය

30. සේවය සඳහා ස්ථාපිත දේව ප්‍රසාද නිධාන අනෙකුත් දේව ප්‍රසාද නිධාන වලින් වෙනස්වීමට බලපාන හේතුවක් නොවන්නේ
1 ධර්මදූත මෙහෙවරක් පැවරීම
2 ආත්මික හා ශාරීරික සුවයක් ලැබීම
3 දේව ජනතාව ගොඩනැගීම
4 අන් අය ගැලවීම තුළින් තම ගැලවීම සලසා ගැනීම

31. තාපය පැවිදි ජීවිතයට විනය මාලාවක් සකස් කිරීමට මූලික වූ පුද්ගලයන් දෙදෙනෙකු වන්නේ
1 බැසිල් තුමා හා ජෙරොම් තුමා
2 අගෝස්තීනුතුමා හා බැසිලි තුමා
3 බෙනඩික් තුමා හා ජාකොබ් සියස් තුමා
4. ජෙරොම් තුමා හා බෙනඩික් තුමා

32. සාන්ත වින්සන්ද පාවුලා සමිතිය ආරම්භ කිරීමට මූලික වූයේ
1 ෆ්‍රැන්ක් ඩෙෆ් මහතා
2 ගොඩ්වින් මෙන්ඩිස් මහතා
3 පෙඩ්රික් ඕසනාම් තුමා
4 මයිකල් රුද්‍රිගු පියතුමා

33. රැකබලා ගැනීම යන අරුත ඇති හේබ්‍රෙව් වචනය වන්නේ
1 ආබාදී
2 රාදා
3 හොක්මා
4 ෂාමාර්

34. ස්වාමිවාක් ආරාධනාව යැදුමේ අන්තර්ගතය ඇතුලත්වන නිර්මාණය වී ඇති ගීතිකාවක් වන්නේ
1 කමා කළ මැනේ සුරිඳුනි
2 ත්‍රී එක සුර ජේසුනි
3 සුරලොව දෙව්දුට මහිමය හිමිවේවා
4 තෙල්මල් සුවඳ සඳුන්

35. ස්වර්ගාරෝපණය යනු
1 සකල පාපයෙන් නිදොස් වීමයි
2 තමන්ගේ බලයෙන්ම ස්වර්ගය කරා ගමන් කිරීම
3 දේව වරප්‍රසාදයෙන් පූර්ණ වීම
4 තවත් කෙනෙකු විසින් ස්වර්ගයට ඔසවා ගැනීම

36 සැඳෑයාම යැදුමේදී යොදා ගනු ලබන්නේ
1 මරිය උදාන ගීය
2 සෙකරියස්තුමාගේ ප්‍රශංසා ගීය
3 සිමියොන්තුමාගේ ප්‍රශංසා ගීය

www.edudept.up.gov.lk

4 ජුසේතුමාගේ ප්‍රශංසා ගීය

37 ධ්‍යානශීලී භාවනාවේ මෙඩිටාසියෝ නැමති පියවරේද සිදු කරනු ලබන ක්‍රියාව වන්නේ
1 ශුද්ධ ලියවිල්ල කියවීම
2 දේව වචනය ඇසුරින් යාච්ඤා කිරීම
3 දේව වචනය මෙනෙහි කිරීම
4 දේව වචනය ඇසුරෙන් ස්වාමීන් වහන්සේ තුළ රැඳී සිටීම

38 19 වන සියවසේදී ඉස්මතු වූ වේද භේදයකි
1 ක්වායටිසම් 2 ජන්සෙනියම් 3 ඔරාසියෝ 4 ලෙක්සියෝ

39 මිස්ටෙරියුම් ෆිඩෙයි හෙවත් විශ්වාසයේ අභිරහස නැමති විශ්ව ලේඛනය ලියන ලද්දේ
1 v වන පාවුලු ශුද්ධෝත්තම පියතුමා
2 vii වන පාවුල් ශුද්ධෝත්තම පියතුමා
3 ii වන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමා
4 vi වන පාවුලු ශුද්ධෝත්තම පියතුමා

40 අද ලොව පුරා පවතින විවිධ විනාශකාරී ක්‍රියාවන්ට හේතුව වන්නේ
1 අසීමිත ලෙස ධනයට හා බලයට වහල් වීමය
2 නවීන විද්‍යාත්මක හා තාක්ෂණික දැනුමට මුල් තැන දීමය
3 මිනිසා දෙවියන් වහන්සේගේ සැලැස්මට පිටුපෑමය
4 තමා සැමවිටම නිවැරදි යැයි සිතීමය

www.edudept.up.gov.lk